## සංක්ෂිප්තය

සම්පත් බෙදීයාමේ අසමානතාවය මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය සම්පත් ඌනතාව ශ්‍රී ලංකාවේ පාසල් බොහෝමයක් මුහුණ දෙන ගැටලු බව හඳුනාගෙන ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වචනවලට පමණක් සීමා කළවිට සිසුන්ට මනා වූ ඉගෙනුම් අත්දැකීමක් ලබාගත නොහැකිය. ශිෂ්‍යයාට ඉගෙනුම් අත්දැකීම් සාර්ථක ලෙස ලබාදීමට නම් ඊට අවශ්‍ය භෞතික සම්පත් ලබාදිය යුතුය. සම්පත් බෙදීයාමේ අසමානතාවය ඉවත් කිරීමටත් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමටත් ගුණාත්මක යෙදවුම් සංරචකය ක්‍රියාත්මක විය. විශාල මුදල් සම්භාරයක් වැයකර ලබාදෙන මෙම මුදල්වලින් මිලදී ගන්නා සම්පත් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සඳහා කොතෙක් දුරට භාවිත කරන්නේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මඟින් සිදුකරන ලදී.

ගුණාත්මක යෙදවුම් ක්‍රියාදාමයෙහි නෛතික තත්ත්වය පිළිබඳ පාසල් අභ්‍යන්තර ප්‍රජාවගේ දැනුවත්භාවය හා ගුණාත්මක යෙදවුම් කළමනාකරණය පිළිබඳ විදුහල්පතිගේ භූමිකාව සොයා බලන ලදී. එමෙන්ම ගුණාත්මක යෙදවුම් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ ගුරුභවතුන්ගේ අදහස් විමසීමක් කරනු ලැබීය. එසේම ගුණාත්මක යෙදවුම් ලබා ගැනීමේ දී හා භාවිත කිරීමේ දී පාසල මුහුණපාන ගැටලු හා ගුණාත්මක යෙදවුම් ක්‍රියාදාමය වඩා සාර්ථකව ඉටුකරගැනීමට ගුණාත්මක යෙදවුම් භාවිත කරන්නන්ගේ අදහස් හා යෝජනා විමසා බැලීමත් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.

පර්යේෂණය සඳහා කුරුණෑගල අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍යයෙන් අධ්‍යයන කටයුතු මෙහෙයවන 1 ඒබී. 1 සී හා 2 වර්ගයේ පාසල්වලට මෙම අධ්‍යයනය සීමාවිය. පර්යේෂණය සඳහා පාසල් 9 ක් තෝරා ගන්නාලදි. තොරතුරු ලබාගැනීමට නියැදියට අයත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරු, ගුරුවරු, සිසුන් හා ලිපිකරුවන් අහඹු හා සහේතුක නියැදුම් ක්‍රම භාවිතයෙන් තෝරාගනු ලැබීය. විදුහල්පතිවරු 9 දෙනෙකුගෙන් නියෝජ්‍ය විදුහල්පතිවරු 9 දෙනෙකුගෙන්, ගුරුවරු 54 දෙනෙකුගෙන් සිසුන් 54 දෙනෙකුගෙන් හා ලිපිකරුවන් 9 දෙනෙකුගෙන් ලබාගත් දත්ත සරල සංඛ්‍යාත ක්‍රම ඇසුරින් විශ්ලේෂණය සහ අර්ථකථනය කරනු ලැබීය. පර්යේෂණයට අදාළ නිගමන පර්යේෂණ අරමුණු අනුව දක්වා ඇත.

සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය තුළින් පෙනීගිය වැදගත් කරුණු කිහිපයකි. ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන පාසල්වලට නියමිත වේලාවට නොලැබීම, විදුහල්පතිවරු හා නියෝජ්‍ය

විදුහල්පතිවරුන් තුළ ගුණාත්මක යෙදවුම් ක්‍රියාදාමය පිළිබඳ දැනුවත්භාවයක් තිබුණද ගුරුවරුන් ලිපිකරුවන් හා සිසුන් තුළ ගුණාත්මක යෙදවුම් ක්‍රියාදාමය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බව අනාවරණය විය. එසේම භාණ්ඩ මිල දී ගැනිමේ දී විදුහල්පතිවරුන් තම අභිමතය පරිදි භාණ්ඩ මිලදී ගන්නා බවත්, ගුණාත්මක යෙදවුම් මිල දී ගැනීමේ හා ඇගයීමේ කමිටුවල සාමාජිකත්වය බෝඩ්වලට පමණක් සීමා වී තිබූ බවත්, ගුණාත්මකභාවය පිළිබඳ සොයා බැලීමකින් තොරව භාණ්ඩ මිල දී ගන්නා බවත් අනාවරණය විය. එසේම ගුණාත්මක යෙදවුම් සිසුන්ට ප්‍රමාණවත් නොවන බවත් ඒවා පංති කාමරයේ භාවිත කිරීම අවම මට්ටමක පවතින බවද හෙළිවිය. එපමණක් නොව ගුරුවරුන්ට ගුණාත්මක යෙදවුම් ආරක්ෂිතව තබා ගැනීමේ ගැටලු ඇති බවත් අනාවරණය විය.

මේ අනුව ගුණාත්මක යෙදවුම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා පියවර ගතයුතුව ඇත. ඒ අනුව ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන වර්ෂය මුලදීම පාසල්වලට ලබාදීම සිදුවිය යුතුව ඇත. එමෙන්ම ගුණාත්මක යෙදවුම් ක්‍රියාදාමය පිළිබඳ ගුරුවරුන් ලිපිකරුවන් හා සිසුන් දැනුවත්කිරීමේ වැඩ සටහන් ඇති කිරීම සිසුන්ට ප්‍රමාණවත් ලෙස ගුණාත්මක යෙදවුම් ලබාදීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ගුණාත්මක යෙදවුම් යොදා ගැනීමේ අවස්ථා වැඩිකිරීම, ගුණාත්මක යෙදවුම් ආරක්ෂිතව පරිශීලනය කිරීමට හැකි වැඩපිළිවෙළක් පාසල තුළ ඇති කිරීම ආදී ක්‍රියාමාර්ග සිදුකළ යුතුව ඇත.

මෙම පර්යේෂණය තුළින් පාසල් පද්ධතියේ නියමුවන් ලෙස කටයුතු කරන විදුහල්පතිවරුන්ටත් ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන පාසල්වලට සම්පාදකයන්ටත් ගුරුවරුන්ටත් සිය වෘත්තීමය කාර්යයන් සාර්ථක කර ගැනීමේ දී ආධාරකයක් වේයැයි අපේක්ෂා කෙරේ.

**ABSTRACT**

The majority of the government schools have to face the problems which are inequalize of distributing the resources and the lack of essential resoruces to give a high quality educaiton.

When learning and teaching process is limited only to the words. The children are unable to get the learning experience well. The physical resources which are needed to the child should be supplied to get the learning experience of the student successfully. The quality inputs are implemented to avoid the distributing of the inequalise resources and to give quality education. The researcher launched this research to study, how to use the resources which are given by the government for learning and teaching process.

The aims of the thesis are that to make aware the school internal community about the legal situation of the quality input process, and it is considered the way of managing by the principals; observing the way of using the quality input for the process of learning by the students and teachers. Identify the problems that the schools faced when the quality input is provided or used, it is observed that the ideas and suggestions to get success of quality input process well is observed.

This theis is confined to grade 1AB, 1C, and grade 2 sinhala medium schools in the Kurunegala education zone of the Kurunegala district. Nine schools in this zone were selected as the sample. The principals, the vice principals, the teachers, the clerks and the students were selected to gather information using the random sample survey. Information was collected through questionaires, interviews and observation. Finally the data thus collected were analysed and interpreted using percentage, tables and Graphs.

It is revealed that the money allocated to these schools is provided in the middle of the year or end of the year. In addition to that an awareness of the internal community about the quality input process was in low level and it is visualized that the suppliers who supply the goods that are not in good quality. It is revealed that the quality inputs which were distributed among the students in the schools were not sufficient. It shows that the lack of well protected places to keep

until they were issued and there was not well planned process for the distribution of quality inputs to the teachers. It makes clear that the use of the quality inputs in the class rooms was at a low level. It is revealed that the internal and external supervision to check the use of the quality inputs were not in a proper manner. It shows that the goods were bought without legal tender notice or under the tender system. Quality inputs should be used efficiently to improve the quality of education. There is no doubt that the study of the use of quality inputs will be helpful to the provide resource suppliers who from the resources the schools and all the other related ones.